සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**තෙවන වාර පරීක්ෂණය**
**மூன்றாம் தவணைப் பரீட்சை - 2026**
**Third Term Test**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 13 | විෂයය / பாடம் / Subject } ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper } I | පැය / மணித்தியாலம் / Hours } 3.10 |

**උපදෙස්** ► සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**01.** ශුද්ධ බයිබලයේ නව ගිවිසුමේ කෘති ග්‍රීක භාෂාවෙන් ලිවීමට හේතුව වනුයේ,

(1) වෙනත් භාෂාවක් නොවූ හෙයිනි. (2) අභාවයට යන භාෂාවක් වූ නිසාය.
(3) දේශනා කිරීමට පහසු නිසා ය. (4) මෙම කිසිදු පිළිතුරක් අදාළ නොවේ.
(5) ක්‍රිස්තු පූර්ව 63 රෝම ප්‍රාන්තයක් වූවත් ග්‍රීක භාෂාව භාවිතය.

**02.** දෙවියන් වහන්සේ සඳහා භාවිතා කර ඇති යාවේ යන හෙබ්‍රෙව් වචනය සිංහල ශුද්ධ බයිබලයෙහි පරිවර්තනය කර ඇත්තේ,

(1) දෙවියන් වහන්සේ ලෙසයි. (2) ක්‍රිස්තුස් වහන්සේ ලෙසයි.
(3) සමිඳාණන් වහන්සේ ලෙසයි. (4) ස්වාමීන් වහන්සේ ලෙසයි.
(5) දෙවි සමිදාණන් වහන්සේ ලෙසයි.

**03.** එළියා දිවැසිවරයා හා බාල් පූජකයන් පිළිබඳ සිද්ධිය සිදු වූයේ,

(1) ජෙරුසලම් කන්දේ (2) තාබෝර් කන්දේ (3) මොරියා කන්දේ ය.
(4) කපාල කන්දේ ය. (5) කාර්මෙල් කන්දේ ය.

**04.**

| **A තීරුව** | **B තීරුව** |
|---|---|
| රාදා | (a) වගා කිරීම |
| අපාර් | (b) රැක බලා ගැනීම |
| අබාද් | (c) දූවිල්ල |
| ෂමාර් | (d) පාලනය කිරීම |

ඉහත A තීරුවේ සඳහන් හෙබ්‍රෙව් වචනවල අර්ථ B තීරුව හා ගැලපූවිට පිළිවෙළින් නිවැරදි පිළිතුර වන්නේ,

(1) a, b, c හා d ය. (2) d, c, a හා b ය. (3) b, c, a හා d ය. (4) c, b, a හා d ය.
(5) a, d, b හා c ය.

**05.** මස්සා හා මෙරීබා ස්ථානවල දී මෝසෙස්තුමා තම සැරයටියෙන් පර්වතයට තට්ටු කල විට ජලය ලැබුණු බව සඳහන් වන්නේ,

(1) නික්මයාම පොත (2) ගණන් කතාව (3) උත්පත්ති පොත (4) වීරාවලියේ ය.
(5) ලෙවී ව්‍යවස්ථාවේ ය.

**06.** දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති වූ ගිවිසුම් අතරින් J හා P සම්ප්‍රදායන් දෙකෙහි ම සඳහන් කර ඇති ගිවිසුම වන්නේ,

(1) ආදම් සමග ඇති කරගත් ගිවිසුම ය.
(2) නෝවා සමග ඇති කරගත් ගිවිසුම ය.
(3) ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුම ය.
(4) මෝසෙස් සමග ඇති කරගත් ගිවිසුම ය.
(5) ඊසාක් සමග ඇති කරගත් ගිවිසුම ය.

**07.** දස පනත සඳහන් ශුද්ධ බයිබල් ග්‍රන්ථ දෙක වන්නේ,

(1) උත්පත්ති හා නික්මයාම යි.
(2) නික්මයාම හා ද්විතීය නිතී සංග්‍රහය යි.
(3) ගණන් කතාව හා ලෙවී ව්‍යවස්ථාව යි.
(4) රාජාවලිය හා වංශාවලිය යි.
(5) ගණන් කතාව හා ද්විතීය නීති සංග්‍රහය යි.

**08.** එසකියෙල්, යන්නෙහි අර්ථය කුමක් ද?

(1) සමිඳාණන් වහන්සේ මුදාගන්නා සේක.
(2) සමිඳාණන් වහන්සේ උසස් කළ සේක.
(3) සමිඳාණන් වහන්සේ ගලවන සේක.
(4) දෙවියන් වහන්සේ වපුරන සේක.
(5) දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක.

**09.** යෙසායා දිවැසිවරයා පවසන ආකාරයට මෙසියස් වහන්සේගේ සුලක්ෂණ හතර වනුයේ,

(1) අසිරිමත් උපදේශකයාණෝ ය./ඉශ්රායෙල් හි අධිපතියාණෝ ය./සදාතනික පියාණෝ ය. /සාමයේ කුමාරයාණෝ ය.
(2) අසිරිමත් උපදේශකයාණෝ ය./සාමයේ කුමාරයාණෝ ය./සදාතනික පියාණෝ ය. /පව්කරුවන්ගේ කුමාරයා ය.
(3) අසිරිමත් උපදේශකයාණෝ ය./සාමයේ කුමාරයාණෝ ය./සදාතනික පියාණෝ ය. /දේව අජබාලකයාණෝ ය.
(4) අසිරිමත් උපදේශකයාණෝ ය./ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය./සදාතනික පියාණෝ ය. /සාමයේ කුමාරයාණෝ ය.
(5) අසිරිමත් උපදේශකයාණෝ ය./සදාතනික පියාණෝ ය./සාමයේ කුමාරයාණෝ ය.

**10.** 'ගීතාවලිය බිහි වී ඇත්තේ සමිඳාණන් වහන්සේගේ සිංහාසනාරූඪ මංගල්‍යය පසුබිමෙන්' බව ප්‍රකාශ කරන ලද්දේ,

(1) සිග්මන් ෆ්‍රොයිඩ් ය.
(2) සිග්මන් මොවින්කල් ය.
(3) හර්මන් ගුන්කල් ය.
(4) ආතර් වයිසර්
(5) ටි. එස්. එලියට්

**11.** සමදර්ශක සුභාරංචි කතුවරුන් ක්‍රිස්තුන් වහන්සේගේ මෙහෙවරෙහි හා දෙසුමෙහි ප්‍රධාන තේමාව ලෙස පෙන්වා දෙන්නේ,

(1) දේව රාජ්‍යය
(2) ගැලවීමේ මාර්ගය
(3) උපමා හා ප්‍රතිහාර්යය
(4) මළවුන්ගෙන් උත්ථාන වීම
(5) සදාතනික ජීවිතය

**12.** ශාදොක් නැමැති පූජකයාගෙන් පැවතඑන උත්තම පූජක පදවිය අහිමි කිරීමට විරුද්ධව නැගී සිටි පලස්තීනයේ ආගමික කණ්ඩායම කුමක් ද?

(1) පරිසිවරුන්
(2) සෙලෙට්වරුන්
(3) එසේනිවරුන්
(4) විනයධරයන්
(5) සද්දුසිවරුන්

**13.** ඇතැන්ස් නගරයේ දී ශුද්ධ වූ පාවුලු තුමා දේශනා කළ ශාලාව වූයේ,

(1) ධර්මශාලාවේ දී ය.
(2) මන්ත්‍රණ ශාලාවේ දීය.
(3) දමස්කයේ ශාලාවේ දීය.
(4) ජෙරුසලම් ශාලාවේ දීය.
(5) අරියෝපගය ශාලාවේ දී ය.

**14.** කිසිදු ප්‍රතිලාභයක් නොතකා අන් අය අපට අයහපත කළත්, අයහපත පැතුවත්, ඒ අයට යහපත ම කරන, යහපතම පැතීමේ ලක්ෂණය ග්‍රීක බසින් හඳුන්වන්නේ,

(1) එෆ්ප්‍රාතා ලෙසය. (2) රාදා ලෙසය. (3) අබාද් ලෙසය.
(4) අගපේ ලෙසය. (5) ෂමාර් ලෙසය.

**15.** ධර්මදූත මෙහෙය අවසන් කර වෙනත් දේශයකට යාමේ දී පාදවල දූවිලි ගසා දැමීමට ශ්‍රාවකයන්ට ප්‍රකාශ කිරීම තුළ ගැබ්වී ඇති අර්ථය වනුයේ,

(1) දෙවියන් වහන්සේගේ සුබාරංචිය ප්‍රතික්ෂේප කරන අය වෙත වගකීම පවරනු ලබන බවය.
(2) දෙවියන් වහන්සේගේ සාමය ප්‍රතික්ෂේප කරන අය වෙත වගකීම පවරනු ලබන බවය.
(3) දෙවියන් වහන්සේගේ ආදරය ප්‍රතික්ෂේප කරන අය වෙත වගකීම පවරනු ලබන බවය.
(4) දෙවියන් වහන්සේගේ කරුණාව ප්‍රතික්ෂේප කරන අය වෙත වගකීම පවරනු ලබන බවය.
(5) දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ප්‍රතික්ෂේප කරන අය වෙත වගකීම පවරනු ලබන බවය.

**16.** ත්‍රෝගයින් යන ග්‍රීක වචනයේ අර්ථය වනුයේ,

(1) බෙදා හදාගෙන කෑම ය. (2) විකා කෑම ය. (3) තනි ව කෑම ය.
(4) යැදුමෙන් පසු කෑම ය. (5) එක්වරු ශීලයෙන් පසු කෑම ය.

**17.** ක්‍රිස්තුස් වහන්සේ ස්නාවක ජොහන් තුමාගෙන් බෞතීස්ම ස්නාපනය ලැබීමෙන් අදහස් වනුයේ,

(1) ක්‍රිස්තුස් වහන්සේ ස්නාවක ජොහන් තුමාගේ ශ්‍රාවකයකු බව යි.
(2) ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයා බව යි.
(3) ක්‍රිස්තුස් වහන්සේ මනුෂ්‍යය පුත්‍රයා බව යි.
(4) ක්‍රිස්තුස් වහන්සේ පව්කරුවන්ගේ අනන්‍යතාවය ලබා ගත් බව යි.
(5) ක්‍රිස්තුස් වහන්සේ දේව ආශිර්වාදය ලබා ගත් බව යි.

**18.** පහත දැක්වෙන පීඩන සමයන් තුළ ප්‍රාණ පරිත්‍යාගී වූ ශුද්ධවන්තයින් අධ්‍යනය කරන්න.

(a) ශුද්ධ වූ ලෝරන්ස් තුමා (d) ශුද්ධ වූ ඇලෙක්සැන්ඩර් තුමා
(b) ශුද්ධ වූ අගතා මුනිවරිය (e) ශුද්ධ වූ ෆේබියන් තුමා
(c) ශුද්ධ වූ ෆීලික්ස් තුමා (f) ශුද්ධ වූ ජස්ටින් තුමා
(g) ශුද්ධ වූ දෙවන සික්ස්ටස් පාප්තුමා

ඉහත ශුද්ධවන්තයින් අතරින් අටවන පීඩන සමයේ (වැලේරියන් අධිරාජ සමයේ) ප්‍රාණ පරිත්‍යාගී වූ ශුද්ධවන්තයින් වනුයේ,

(1) a, b (2) b, c, g (3) a, g (4) a, b, c (5) e, f

**19.** මහා ජාකොබ්තුමා කඩුවෙන් මරා දැමුවේ,

(1) තිබේරියස් අධිරාජ්‍යයා ය (2) හෙරෝද් ඇන්ටිපස් රජතුමා ය (3) පිලාත් ආණ්ඩුකාරයා ය
(4) නීරෝ අධිරාජ්‍යයා ය 5) පළමුවන හෙරෝද් අග්‍රිපා රජතුමා ය

**20.** පහත සඳහන් වේද භේදයන් සඳහා වේද සත්‍යතා ඉදිරිපත් වූ මන්ත්‍රණ සභාවන් දැකගත හැකිය.

1. අප්‍රධානතාවාදය (a) නිසියානු මන්ත්‍රණ සභාව
2. ඒරියන් වේද භේදය (b) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව
3. නෙස්ටෝරියානු වේද භේදය (c) කැල්සිඩෝන් මන්ත්‍රණ සභාව
4. එව්ටිකියන් වේද භේදය (d) එපීසි මන්ත්‍රණ සභාව

මෙම වේද භේද සඳහා පිළිතුරු ලබා දුන් මන්ත්‍රණ සභා පිළිවෙලින් ඉදිරිපත් කර ඇති පිළිතුර වනුයේ,

(1) c, b, a, d (2) b, d, a, c (3) c, d, a, b (4) b, c, a, d (5) b, a, d, c

**21.** පළමුවන සෙලස්තියන් ශුද්ධෝත්තම පියතුමා විසින් රැස් කරන ලද එපීසි මන්ත්‍රණ සභාවේ ශ්‍රේෂ්ඨ ධර්මාචාර්යවරයා ලෙස කටයුතු කලේ,

(1) ශුද්ධ වූ ජස්ටින් තුමාය (2) ශුද්ධ වූ පාවුලු තුමාය (3) ශුද්ධ වූ සිරිල් තුමාය
(4) ශුද්ධ වූ ජෙරොම් තුමාය (5) ශුද්ධ වූ අගොස්තීනු තුමාය

**22.** පහත දැක්වෙන්නේ තාපස හා පැවිදි නිකායවල ප්‍රතිසංස්කරණ සමයේ ලියැවුණු අධ්‍යාත්මික කෘති කිහිපයකි.

(a) පූර්ණ දිවියකට මඟ (b) කාර්මෙල් පර්වතය නැඟීම (c) ආත්මයේ අඳුරු රාත්‍රිය
(d) ඇතුළාන්ත මන්දිරය (e) අධ්‍යාත්මික ගීතය

මෙම කෘති අතරින් අවිලාහී ශුද්ධ වූ තෙරේසා තුමිය රචනා කරන ලද අධ්‍යාත්මික කෘති වන්නේ,

(1) a, d පමණි (2) b, c, a පමණි (3) a, d, e, f පමණි
(4) b, c, e, f පමණි (5) b, e, f පමණි

**23.** පාප්වරුන් තම අධිකාරි බලය අපෝස්තුලුවරුන් මාර්ගයෙන් ක්‍රිස්තුස් වහන්සේගෙන් ලබා ඇති බවත්, එම නිසා ඔවුන් සතු බලය ඉතා උසස් බවත් ප්‍රකාශ කිරීම සඳහා හත්වන ග්‍රෙගරි පාප් තුමා නිකුත් කළ ලේඛනයේ නම කුමක්ද?

(1) Pacem in Terris (2) Mater et Magistra (3) Rerum Novarum
(4) Dictus Papae (5) Vatican II

**24.** පාද්‍රොආඩෝ හෙවත් යටත් විජිතවල කිතු සසුනේ ආරක්ෂක භාරය පෘතුගාලය හා ස්පාඤ්ඤය අතර ඇති කර ගැනීමට මූලිකත්වය ගත් ශුද්ධෝත්තම පියතුමා කවුද?

(1) දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
(2) අති උතුම් සයවන ඇලෙක්සැන්ඩර් ශුද්ධෝත්තම පියතුමා
(3) එකොළොස් වන පියුස් ශුද්ධෝත්තම පියතුමා
(4) විසිතුන්වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා
(5) දහවන පියුස් ශුද්ධෝත්තම පියතුමා

**25.** පර්සියාවෙන් පැමිණි ක්‍රිස්තු භක්තිකයන් ලක්දිව සිටි බවට තම ග්‍රන්ථයක සඳහන් කරන ලද්දේ,

(1) E.R. අයර්ටන් ය. (2) ජේම්ස් පීරිස් ය. (3) පීටර් පිල්ලේ ය.
(4) සෙනරත් පරණවිතාන ය. (5) කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් ය.

**26.** බ්‍රිතාන්‍ය සමයේ දී ලාංකිකයන්ට ලැබුණු ආගමික නිදහස පූර්ණ වූයේ,

(1) සීනායි ගිවිසුමෙනි. (2) මැග්නා කාටර් පනත මගිනි.
(3) පාද්‍රොආඩෝ ගිවිසුම මගිනි. (4) ජේම්ස් ස්ටුවර්ට් ගිවිසුමෙනි.
(5) තෝමස් මේට්ලන්ඩ් ගිවිසුමෙනි

**27.** පහත වාක්‍යයන් අධ්‍යනය කරන්න.

(a) ළමයි පාසල් නොයවන දෙමාපියන්ට දඩ ගැසීම සිදුවිය.
(b) විධිමත් පාසල් අධ්‍යාපනයක් ලබා දීම ආරම්භ කරන ලදී.
(c) අධ්‍යාපනය පිළිබඳ ඍජු වගකීම රජය විසින් බාර ගන්නා ලදී.
(d) අපරදිග භාෂා හා අපරදිග අධ්‍යාපන ක්‍රම මෙරට ව්‍යාප්ත කරන ලදී.
(e) දඩ මුදල් එකතු කිරීමට කතිකිස්තවරුන් පත් කරන ලදී.

ඉහත වාක්‍ය අතරින් ලන්දේසි සමයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට බලපාන ලද කරුණු වන්නේ,

(1) b පමණි (2) d, e පමණි (3) b, d පමණි (4) a, c, d පමණි (5) a, c, e පමණි

**28.** 1960 දී ආධාර ලබන ආගමික පාසල් රජයට පවරා ගැනීම නිසා කිතුනුවන්ට දහම කියාදීමට ................................ හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) මීසම් මට්ටමින් දහම් පාසල් ඇති විය. (2) දේවස්ථාන ඇති විය.

(3) දේවස්ථානවල සමිති සමාගම් ඇති විය. (4) පදවි මට්ටමින් පාසල් ඇති විය.

(5) දහම් ගුරුවරු ඒකරාශි විය.

**29.** මිනිසාගේ උතුම්කම රඳා පවතින සාධකයක් වනුයේ,

(1) ජීවිතයේ සරලකම ය. (2) මිනිසාගේ හෘදය සාක්ෂියයි. (3) මිනිසාගේ දයාවයි.

(4) මිනිසාගේ සංවේදීභාවයයි. (5) මිනිසාගේ කරුණාවයි.

**30.** එංගලන්ත-රෝමානු කතෝලික අන්තර් ජාතික කොමිසම ආරම්භ කරන ලද්දේ,

(1) කැන්ටබරියේ අගරදගුරු අති උතුම් මයිකල් රම්සි හා අති උතුම් සවන පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසිනි.

(2) කැන්ටබරියේ අගරදගුරු අති උතුම් මයිකල් රම්සි හා අති උතුම් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසිනි.

(3) කැන්ටබරියේ අගරදගුරු අති උතුම් සිරිල් හා අති උතුම් පළමු වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන් විසිනි.

(4) කැන්ටබරියේ අගරදගුරු අති උතුම් විලියම් බූත් හා අති උතුම් සවන පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසිනි.

(5) කැන්ටබරියේ අගරදගුරු අති උතුම් රෆායල් රම්සි හා අති උතුම් සයවන පියුස් ශුද්ධෝත්තම පියතුමන් විසිනි.

**31.** දිව්‍ය සංරක්ෂණය නම් විශ්ව ලේඛනයේ ශුද්ධ බයිබලයේ කර්තෘත්වය සම්බන්ධව කරුණු ඉදිරිපත් කළ ශුද්ධෝත්තම පියතුමන් වන්නේ,

(1) අති උතුම් 2 වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් ය.

(2) අති උතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන් ය.

(3) අති උතුම් 14 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් ය.

(4) අති උතුම් 12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් ය.

(5) අති උතුම් 11 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමන් ය.

**32.** පර්සියානු යුගයේදී බැබිලෝනියාවේ ජීවත් වූ ජුදෙව්වන් අදියර තුනක් යටතේ තම මව්බිම කරා පැමිණෙන ලදී. ඒ අනුව ක්‍රි. පූ 444 දි තෙවන කණ්ඩායම රැගෙන ඒමට මූලික වූ පුද්ගලයා වන්නේ,

(1) එස්රා (2) සෙරුබ්බාබෙල් (3) ජෝෂුවා (4) එස්තර් (5) නෙහෙමියා

**33.** අසිරියානු විප්‍රවාසය සමයේ උතුරු රාජ්‍යයේ පැවති වන්දනා ස්ථාන වන්නේ,

(1) දාන් හා නප්තලී. (2) බෙතෙල් හා දාන්. (3) ෂෙකෙම් හා දාන්.

(4) ෂෙකෙම් හා කානාන්. (5) බෙතෙල් හා ෂෙකෙම්.

**34.** ශුද්ධ බයිබලයට අනුව ස්ත්‍රිය හා පුරුෂයා සම තත්වයකට උරුමකම් කියන්නේ,

(1) ස්ත්‍රිය නම් කිරීම ආදම් සිදු කළ නිසා ය. (2) ස්ත්‍රිය නම් කිරීම ආබ්‍රහම් සිදු කළ නිසා ය.

(3) ස්ත්‍රිය නම් කිරීම ඊසාක් සිදු කළ නිසා ය. (4) ස්ත්‍රිය නම් කිරීම ඇය විසින් ම සිදු කළ නිසා ය.

(5) ස්ත්‍රිය නම් කිරීම කර්මකාරකයෙන් ශුද්ධ බයිබලයේ යොදා ඇති නිසා ය.

**35.** නික්මයාම ගමනේ දී ඉශ්රායෙල් ජනයා මුහුණ දුන් ආක්‍රමණය වනුයේ,

(1) අසිරියානු ආක්‍රමණය යි. (2) මිසර ආක්‍රමණය යි. (3) ග්‍රීක ආක්‍රමණය යි.

(4) රෝම ආක්‍රමණය යි. (5) අමලෙක්වරුන්ගේ ආක්‍රමණය යි.

**36.** ජාකොබ් තුමන් දේව දූතයා සමඟ පොරබැදූ ස්ථානය වනුයේ,

(1) පෙනුයෙල් ය. (2) මස්සා ය. (3) මෙරීබා ය.

(4) හොරෙබ් ය. (5) සීනයි ය.

**37.** සීනයි ගිවිසුම මඟින් ඉශ්රායෙල් ජනතාව ලද විශේෂ වරප්‍රසාදයක් වූ කැප වූ ජාතියක් වීම යන්න සඳහා හෙබ්‍රෙව් භාෂාවෙන් යොදා ඇති යෙදුම වනුයේ,

(1) ෂමාර් ය. (2) අබාද් ය. (3) ගෝය් කඩෝෂ් ය.

(4) සෙගුල්ලාහ් ය. (5) රෙහොබොත් ය.

**38.** උතුරන තෙල් කටාරමකට දමා එයින් අනතුරක් නොවූ නිසා පැට්මොස් නම් දූපතකට පිටුවහල් කරන ලද්දේ,

(1) ශුද්ධ වූ ජස්ටින් තුමාය. (2) ශුද්ධ වූ පේදුරු තුමාය. (3) ශුද්ධ වූ පාවුලු තුමාය.

(4) ශුද්ධ වූ ලූක් තුමාය. (5) ශුද්ධ වූ ජොහාන් තුමාය.

**39.** පහත සඳහන් නාමයන් අධ්‍යනය කරන්න.

A. ස්තේපන් B. පිලිප් C. පේදුරු D. ප්‍රෙකොරස් E පාවුලු F. ජස්ටින් තුමා

මෙම නාම අතරින් උපස්ථායකයන් ලෙස මුල් කිතුනු සමයේ නම් කරන ලද පුද්ගලයන් අයත් පිළිතුර වනුයේ,

(1) A පමණි. (2) CEF ය. (3) DEF ය. (4) ABD ය. (5) ACE ය.

**40.** තලෙයියා ගීත කුමන වේද භේදයට අදාළ ලේඛනයක් වන්නේ ද?

(1) ඒරියන් වාදය (2) අප්‍රධානතාවාදය (3) මොනිපිටියානුවාදය

(4) නෙස්ටෝරියානු වේද භේදය (5) එව්ටිකියන් වේද භේදය

**41.** මුල් යුගයේ කිතුනු ලේඛකයෙකු සභාපියකු වශයෙන් නම් කිරීමේදී සලකා බැලූ කරුණක් නොවන්නේ,

(1) ශුද්ධවත් ජීවිතය (2) ජීවත් වූ කාල කාලවකවානුව

(3) ශුද්ධ වූ සභාවේ අනුමැතිය (4) සභාව වෙනුවෙන් දිවි පිදීමය

(5) ඉදිරිපත් කළ ධර්මයේ නිරවද්‍යතාවය

**42.** පළමු වන වතිකාන මන්ත්‍රණ සභාව කැඳවන ලද ශුද්ධෝත්තම පියතුමා වන්නේ,

(1) අතිඋතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන්ය.

(2) අතිඋතුම් 11 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ය.

(3) අතිඋතුම් 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමන්ය.

(4) අතිඋතුම් 12 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ය.

(5) අතිඋතුම් 9 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන්ය.

**43.** ශුද්ධ වූ කොලුම්බා තාපස තුමා ආරම්භ කරන ලද තාපසාරාමයේ නම වනුයේ,

(1) බෙනදිකාන තාපසාරාමයයි. (2) සිස්ටර්සියන් තාපසාරාමයයි.

(3) ක්ලුනි තාපසාරාමයයි. (4) සෙල්ටික් තාපසාරාමයයි.

(5) මොන්ට්කසීනෝ තාපසාරාමයයි.

**44.** ධර්ම ප්‍රචාරය සඳහා ධර්මදූතවරු අනුගමනය කළ ධර්ම ප්‍රචාරන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A. ආගමික පත පොත දේශීය භාෂාවන්ගෙන් ලිවීම.

B. කුඩා දරුවන්ට දහම ඉගැන්වීමට ප්‍රාථමික පාසල් ඇරඹීම.

C. පරීක්ෂකවරුන් මඟින් පාසල් නිරීක්ෂණය කිරීම.

D විවිධ දයාවේ සේවාවන්හි නිරත වීම.

E. ළමුන් පාසල් නොයවන දෙමාපියන්ට දඬ ගැසීම.

ඉහත සඳහන් ධර්ම ප්‍රචාරන ක්‍රම අතරින් පෘතුගීසි ධර්මදූතවරු භාවිත කළ ධර්ම ප්‍රචාරන ක්‍රම අයත් පිළිතුර වනුයේ,

(1) ABE (2) CDE (3) ABD (4) BCE (5) ADE

**45.** ලෝක සභා සමුළුවට (World Council of Churches) අයත් වන රටවල් ගණන වනුයේ,

(1) 110 කට වඩා වැඩිය. (2) 50 වැඩිය. (3) 200 කට වඩා වැඩිය.

(4) 75 කට වඩා වැඩිය. (5) 80 කි.

**46.** ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල රදගුරු හිමිපාණන් වනුයේ,

(1) අති උතුම් රායප්පු ජෝශප් රදගුරුතුමා (2) අති උතුම් එම්ලියානුස් පිල්ලේ රදගුරුතුමා

(3) අති උතුම් එම්මැනුවෙල් ප්‍රනාන්දු රදගුරුතුමා (4) අති උතුම් එඩ්මන් පීරිස් රදගුරුතුමා

(5) අති උතුම් ජෝශප් මරිය රත්නම් රදගුරුතුමා

**47.** ගෞරවාන්විත ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ නිකාය වනුයේ,

(1) ද ලා සාල් නිකාය. (2) නිර්මල මරිය නිකාය. (3) ජේසු නිකාය.

(4) ඔරතෝරියානු නිකාය. (5) කාර්මෙල් නිකාය.

**48.** නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ශුද්ධ වූ සභාව මුහුණ දුන් ප්‍රධාන ගැටලු දෙක වනුයේ,

(1) පාසල් රජයට පවරා ගැනීම හා පැවිදි සොහොයුරියන් රජයේ රෝහල් සේවයෙන් ඉවත් කිරීම ය.

(2) පාසල් රජයට පවරා ගැනීම හා පැවිදි සොහොයුරියන් රටින් පිටුවහල් කිරීම ය.

(3) පැවිදි සොහොයුරියන් රජයේ රෝහල් සේවයෙන් ඉවත් කිරීම හා පූජා ප්‍රසාදීන් වහන්සේලා රටින් පිටුවහල් කිරීම ය.

(4) ශ්‍රී ලංකාව තුළ ශුද්ධ වූ සභාව මෙහෙය වීමට රදගුරුතුමකු නොමැතිවීම ය.

(5) පාසල් රජයට පවරා ගැනීම හා සභා නායකත්වයේ දුර්වලතා ය.

**49.** මිනිසත්කම උදෙසා කාලය, ශ්‍රමය හා ධනය වැය කළ යුතු බවට ක්‍රිස්තුන් වහන්සේ වදාළේ කුමන උපමා කතාව මඟින් ද?

(1) වපුරන්නා පිළිබඳ උපමාවෙනි. (5) කිරිඳි පිළිබඳ උපමාවෙනි.

(2) ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවෙනි. (3) යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාවෙනි.

(4) යහපත් බැටලු එඬේරා පිළිබඳ උපමාවෙනි.

**50.** දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ සංවාදය හා සභා සමගිය පිළිබඳ කතෝලික සභාවේ ඉගැන්වීම් අයත්වන නියෝගයන් වන්නේ,

(1) පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය හා කිතුනු සභා ඒකත්වය නගාලීමේ නියෝගය.

(2) පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය හා පූජක පුහුණුව පිළිබඳ නියෝගය.

(3) පූජක ජීවිතය හා සේවාවන් පිළිබඳ නියෝගය හා කිතුනු සභා ඒකත්වය නගාලීමේ නියෝගය.

(4) ගිහි ධර්මදූත සේවාවන් පිළිබඳ නියෝගය හා පූජක ජීවිතය හා සේවාවන් පිළිබඳ නියෝගය

(5) පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය හා පැවිදි දිවිය කාලානුරූප කිරීම පිළිබඳ නියෝගය.

(ලකුණු $1 \times 50 = 50$)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - **2026**
**Third Term Test**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 3 |

**උපදෙස්**

► පළමු කොටසින් ප්‍රශ්න 2 ක් ද, දෙවන කොටසින් ප්‍රශ්න 3 ක් ද, තෝරා ගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.

## I - කොටස

**01.** (i) සෙප්තුවාජින්ත බයිබලයට අනුව ශුභාරංචි යන පදයට ලබා දෙන ග්‍රීක පදය ලියා දක්වන්න.
(ලකුණු 1 × 2 = 2)

(ii) සමදර්ශක ගැටළුව පිළිබඳ ඉදිරිපත් වූ විවිධ මත හතරක් නම් කරන්න.
(ලකුණු 2 × 2 = 4)

(iii) ශුද්ධ වූ මතෙව් තුමාගේ ශුභාරංචිය ජුදෙව් කිතුනුවන් වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ශුභාරංචියක් බව ප්‍රකාශ වන, ශුද්ධ වූ මතෙව් ශුභාරංචියේ සඳහන් ජුදෙව් ලක්ෂණ 06 ක් ලියා දක්වන්න.
(ලකුණු 1 × 6 = 6)

(iv) ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතයෙන් වර්ථමාන කිතුනුවන්ට ගත හැකි ආදර්ශ හතරක් පැහැදිළි කරන්න.
(ලකුණු 2 × 4 = 8)

**02.** (iii) 1505 දී ගාලු වරායට සේන්දු වූ නෞකාවේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලද්දේ කවුරුන් ද?
(ලකුණු 1 × 2 = 2)

(iii) ගරු ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධව ඉදිරිපත් කරන ලද වාර්ථාවේ සඳහන් යෝජනා හතරක් නම් කරන්න.
(ලකුණු 1 × 4 = 4)

(iii) ශ්‍රී ලංකාව තුළ පෘතුගීසීන් පැමිණීමට පෙර කිතුනුවන් ජීවත් වූ බවට සාක්ෂි 06 ක් සඳහන් කරන්න.
(ලකුණු 1 × 6 = 6)

(iii) ශ්‍රී ලංකාව තුළ පැවති පෘතුගීසී ධර්මදූත කටයුතු මගින් වර්තමාන ලාංකීක ගිහියන්ට ගත හැකි ආදර්ශයන් හතරක් ලියා දක්වන්න.
(ලකුණු 2 × 4 = 8)

03. (i) කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවේ දී වේද සත්‍යතාවයන් තහවුරු කිරීම සඳහා දායකවූ සභා පියවරුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු $1 \times 2 = 2$)

(ii) මුල් කිතුනු සභාවේ දී ඉදිරිපත් වූ විජාතීන්ට සුබ අස්න දේශනා කිරීමේ දී සිදු වූ සිද්ධීන් දෙකක් ලියා දක්වන්න. (ලකුණු $2 \times 2 = 4$)

(iii) මිලාන් ආඥාව මගින් කිතුනුවන්ට ලබා දෙන ලද වරප්‍රසාද තුනක් ලියා දක්වන්න. (ලකුණු $2 \times 3 = 6$)

(iv) මුල් කිතුනුවන් පීඩන සමයේ දී ජීවත් වූ ආකාරයෙන් ඔබගේ වර්තමාන ජීවිතයට ගත හැකි ආදර්ශයන් 04 ක් ඉදිරිපත් කර පැහැදිළි කරන්න. (ලකුණු $2 \times 4 = 8$)

## II - කොටස

04. (i) ප්‍රසාද ස්නාපනය තුළින් හිමිවන ත්‍රිවිධාකාර කැඳවීම් නිසියාකාරව ඉටු කරන ආකාරය කරුණු 05 කින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) සභා පියවරුන්ගේ ආකල්ප හා ශුද්ධවන්ත ජීවිත ආදර්ශයට ගනිමින් වර්තමාන සභාවේ දියුණුවට පාසල් සිසුවියක/ සිසුවකු වශයෙන් ඔබට කළ හැකි දෑ කරුණු 05 ක් විස්තර සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 10)

05. (i) මෙසියස් වහන්සේ පිළිබඳ යෙසායා දිවැසිවරයාගේ පොතේ 11 වන පරිච්ඡේදයේ 1-9 වගන්ති වල සඳහන් සාම රාජ්‍යයේ ප්‍රතිඵල 05 ක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 10)

(ii) ශුද්ධ වූ මතෙව්තුමාගේ සුබාරංචියේ කන්ද උඩ දේශනාවන්ට අයත් සභාවේ සාංඝිකත්වය හා එහි අධිකාරිත්වය පිළිබඳ දේශනයේ සඳහන් සභා නායකයන් පෙරමුණ ගත යුතු ධර්මදානීය වගකීම් පහක් විස්තර සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

06. (i) 16 වන සියවසේ කතෝලික සභාව තුළ ඇති වූ ප්‍රතිසංස්කරණ ඉතා ඉක්මනින් ප්‍රචලිත වීමට බලපෑ සාධක 05 ක් පැහැදිළි කරන්න. (ලකුණු 10)

(ii) පාසල් ශිෂ්‍යයෙකු - ශිෂ්‍යාවක වන ඔබ, මිනිස් බවේ ගරුත්වය ඉස්මතු කර දැක්විය හැකි අවස්ථා 05 ක් ශුද්ධ බයිබලය ඇසුරින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

07. (i) විවිධ සභා පියවරු ශුද්ධ වූ සභාවට දැක්වූ දායකත්වය කරුණු පහකින් උදාහරණ සපයමින් සනාථ කරන්න. (ලකුණු 10)

(ii) අති උතුම් 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමාගේ ධර්මදූතික ක්‍රියා මගින් වර්තමාන පූජාප්‍රසාදීන් වහන්සේලාට ගත හැකි ආදර්ශයන් පහක් විස්තර සහිතව ලියා දක්වන්න.

(ලකුණු 10)

08. (i) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැළඳීම සම්බන්ධව ගොඩනැගී ඇති ඉගැන්වීම් 05 ක් විස්තර සහිතව ලියා දක්වන්න. (ලකුණු 10)

(ii) ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූතික ජීවිතය මගින් වර්ථමාන කිතුනුවන්ට ගත හැකි මග පෙන්වීම් 05 ක් විස්තර සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)